## කොලොන්න ප්‍රාදේශීය සභාව
## රත්නපුර දිස්ත්‍රික්කය

01. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 13 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 21 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කොලොන්න ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී ආයුර්වේද ආධාර වශයෙන් ලද රු. 193,100 ක ඖෂධ තොග ආදායම් ආධාර වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල ආයෝජන පොලී රු. 42,883 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු ලෙස රු. 11,332,730 ක් හඳුනාගෙන ඇතත්, ගිණුම් මඟින් ලැබිය යුතු මුද්දර ගාස්තු ලෙස රු. 11,470,039 ක් දක්වා තිබුණි. ඒ අනුව ලැබිය යුතු රු. 137,309 ක මුද්දර ගාස්තු ආදායම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් හා වගකීම් අතර රු. 328,776 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස අවිනිශ්චිත ගිණුමකට ගලපා හෝ වැරදි හඳුනා ගැනීමට පියවර ගෙන නොතිබුණි. නිරීක්ෂණය වූ පරිදි එයට බලපා තිබුණේ විවිධ ණයහිමියන්ගේ ලී බඩු හා සවිකිරීම් සහ ගබඩා ණයහිමි සම්බන්ධයෙන් වූ වෙනස්කමය.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 08 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන් අතර රු. 1,834,407 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) වැය ශීර්ෂ 05 කට අදාලව වැය ලෙජරයේ ශේෂය හා මූල්‍ය ප්‍රකාශනය අනුව ශේෂයන් සන්සන්දනය කිරීමේදී රු. 56,134 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම
-----------------------------------------------------

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව. | අනුකූල නොවීම්. |
|---|---|
| (අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත 132(ඒ) වගන්තිය | උත්සව කටයුතු වලදී ප්‍රාදේශීය සභා අරමුදලින් වර්ෂයකට වැයකළ හැකි උපරිම මුදල රු. 1,000 ක් වුවද, එම විධිවිධානයට පටහැනිව තම බල ප්‍රදේශයෙන් බැහැරව පිහිටි ආයතනයකට අදාලව එනම්, ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශයට අයත් ඇඹිලිපිටිය සතිපොල විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් තොරණක් ඉදිකිරීම සඳහා රු. 150,000 ක ප්‍රාදේශීය සභා අරමුදලින් වැය කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371(2) | දෙන ලද අතුරු අග්‍රිමයක් එම දෙන ලද කාර්යයන් නිම කල විගසම පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට නොපියවූ අත්තිකාරම් රු.83,310 ක් විය . |

02. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 12,838,482 ක්වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායමට වඩා වැඩිවූ පුනරාවර්තන වියදම රු. 1,099,507 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
--------------------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 13,937,990 කින් වැඩිවී තිබූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 1267 ක වැඩිවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් වල වැඩිවීම හා පුනරාවර්ථන වියදම්වල අඩුවීමයි.

2.3 ආදායම් පරිපාලනය
-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ලේකම්වරයා විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| --- | --- | --- | --- |
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 1,056 | 747 | 328 |
| බදු කුලී | 3,438 | 2,987 | - |
| බලපත්‍ර ගාස්තු | 532 | 1,299 | - |
| වෙනත් ආදායම් | 25,426 | 29,126 | 14,144 |

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී බදු ආදායම්, බදුකුලී ආදායම්, සේවා සඳහා ගාස්තු, වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් සහ ආධාර යන ආදායම් විෂයයන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 31, සියයට 13, සියයට 37, සියයට 50, සියයට 41 සහ සියයට 51 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇඹිලිපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙතින් 2014 නොවැම්බර් සිට 2015 දෙසැම්බර් දක්වා රු. 11,276,680 ක්, රත්නපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙතින් 2014 දෙසැම්බර් සිට 2015 දෙසැම්බර් දක්වා රු. 21,800 ක් හා අවිස්සාවේල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙතින් 2014 පෙබරවාරි සහ දෙසැම්බර් මාස වෙනුවෙන් රු. 34,250 ක්වූ මුද්දර ගාස්තු සභාව වෙත ලැබී නොතිබුණි.

(ආ) ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙතින් 2015 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා රු. 383,166 ක්වූ උසාවි දඩ ආදායම් ලැබිය යුතුව තිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ සුසාන භූමි ලේඛණය අනුව සුසාන භූමි 18 ක් සඳහන් වුවත්, හඳුනාගත් සුසාන භූමි 22 ක් සඳහා මිනුම් කටයුතු වෙනුවෙන් මිනුම් ගාස්තු ලෙස රු. 295,680 ක් ගෙවා තිබුණි. නමුත් ඉන් අනු රේඛණ ලැබී තිබුණේ සුසාන භූමි 12 කට පමණි. තවද, ප්‍රාදේශීය සභාව මඟින් ලබාගත් තොරතුරු මත ප්‍රදේශයේ සුසාන භූමි 38 ක් පවතින නමුත් එම සුසාන භූමි සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු මෙන්ම අදාල පිඹුරුපත් සභාව සතුව නොතිබූ අතර, ස්ථානීය ආරක්ෂාව සම්බන්ධයෙන්ද තවදුරටත් කටයුතු කිරීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය විය.

(ආ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් ලද WP ZA – 4929 අංක දරණ FOTON බැකෝ යන්ත්‍රය ආයතනයට වාසිදායක පරිදි ආදායම් රැස්කිරීම් හෝ ආයතනයේ කටයුතු සඳහා යෙදවීමට නිසි දැනුමක් සහිත යන්ත්‍ර ක්‍රියාකරුවෙක් සභාව සතුව නොවූ අතර, සභා රියදුරු පුරප්පාඩු හේතුවෙන් වාහන කිහිපයක් එකම රියදුරුට පවරා තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) 1996 වර්ෂයේදී සභා තීරණයක් මත අය කරන ලද බිම් බදු ගාස්තු තක්සේරු කර සංශෝධනය කිරීමකින් තොරව වසර 15 කටත් අධික කාලයක සිට සූරිය කන්ද කඩකාමර වලින් එකම ගාස්තුව අය කර තිබුණි. තවද, මෙකී බදුකරුවන් සමඟ කිසිදු නෛතික ගිවිසුමකට එළඹීමට සභාව 2016 ජුනි 30 දින දක්වා කටයුතු කර නොතිබූ බැවින් එකී ඉඩම් කොටස් අතුරු බදුදීමේ අවධානමෙන් මිදීමට හෝ බිම් බදු ගෙවීම අත්හිටුවීම මත නෛතික ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ සභාවට ඇති අවස්ථාව මඟහැරී ගොස් තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය හරහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ආයතන වල කසල කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා කසල වෙන්කර එකතු කිරීමේ ජාතික වැඩසටහන යටතේ ප්‍රාදේශීය සභාවට රු. 53,328 ක කසල බඳුන් 134 ක ප්‍රමාණයක් ලැබී තිබූ අතර, එම කසල බඳුන් තොග පොත්හි ඇතුලත් කර ගැනීමෙන් තොරව පළාත් පාලන නියෝජිතයින්ගේ අභිමතය පරිදි බෙදාහැර තිබුණි. එම බෙදාහැරීම් වලට අදාල නිර්ණායක විගණනයට ඉදිරිපත් නොවීය.

(ඉ) සභාව සතු සූරියකන්ද නගරයේ කඩ භූමියේ කෙලවරක සභාවට අයත් ඉඩම් කොටසක්ද අත්පත් කර ගනිමින් අනවසර පුද්ගලයෙකු විසින් ස්ථිර දෙමහල් ගොඩනැගිල්ලක් සඳහා සැලසුම් කර ඉන් බිම් මහලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු වී තිබූ නමුත් අනවසර ඉදිකිරීම ඉවත් කිරීමට හා අදාල බිම් කොටස යලි සභාවට අත්පත් කර ගැනීම සඳහා වන ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වී තිබුණි.

3.2 ස්වෙච්ඡා සංවිධාන සඳහා පුටු ලබා දීම

------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් සභා අමාත්‍යාංශය යටතේ ස්වේච්ඡා සංවිධානය සඳහා පුටු ලබාදීමේ වැඩසටහන සඳහා රු. 1,200,000 ක් ලබාදී තිබූ අතර, ඉන් රු. 1,199,379 ක වියදමක් දරා 2015 ජනවාරි 02 දින පුටු 1598, ක් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියාපටිපාටියෙන් බැහැරව මිලදී ගෙන තිබුණි. පුටු තොගය සම්බන්ධයෙන් සභාවේ තොග පොතෙහි ලැබීම් හෝ නිකුත් කිරීම් සම්බන්ධයෙන් සටහන් කිරීමක් සිදුකර නොමැති අතර, සභා මුරකරුගේ දෛනික සටහන් ලේඛණය අනුව සභාවට පුටු ප්‍රවාහනය කර ඇති බවත් ප්‍රාදේශීය සභා සභිකයින් එම පුටු රැගෙන ගොස් ඇති බවත් නිරීක්ෂණය විය.

(ආ) සභිකයින් විසින් රැගෙන ගිය පුටු ස්වේච්ඡා සංවිධාන සඳහා බෙදා තිබූ අතර, එම සංවිධාන තෝරා ගැනීම විධිමත් නිර්ණායකයක් මත සිදුකල බවට තහවුරු නොවුණි. තවද, සභාවේ අධීක්ෂණයකින් තොරව පුටු බෙදා දී තිබුණි.

(ඇ) භෞතික පරීක්ෂාවට අනුව සමිති කිහිපයක නිලධාරීන් එකම කණ්ඩායමක් වන සමිති සඳහාද පුටු 50 බැගින් ලබාදීම සිදුකර තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි සමිතියක් නොවන සමිති සඳහා පුටු 631 ක් ලබාදී තිබුණි.

(ඈ) බෙදාදුන් බවට වාර්තා කර ඇති පුටු සංඛ්‍යාව සහ සත්‍ය වශයෙන් බෙදාදුන් පුටු සංඛ්‍යාව අතර වෙනස්කම් පවතින බව 2016 පෙබරවාරි 08 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඒ අනුව

රු. 18,750 ක් වටිනා පුටු 25 ක් සම්බන්ධයෙන් කිසිඳු තොරතුරක් නිරීක්ෂණය නොවූ අතර, රු. 285,959 ක් වටිනා පුටු 381 ක් සම්බන්ධයෙන් පුටු බෙදාදුන් බවට භෞතිකව තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඉ) මැතිවරණ කොමසාරිස්ගේ 2014 නොවැම්බර් 22 දිනැති ලිපිය ප්‍රකාරව ජනාධිපතිවරණය පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරන තෙක් කාල සීමාව තුල කිසියම් අපේක්ෂකයෙකු දේශපාලන පක්ෂයක ප්‍රවර්ධනය වන ආකාරයට රාජ්‍ය දේපල භාවිතා නොකල යුතුය යන්න අවධාරණය කර තිබියදී එම නියෝග වලට පටහැනිව ජනාධිපතිවරණ කාල සීමාව තුල පුටු බෙදා දීම සිදුකර තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය
-----------------------------

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

i. සබරගමුව පළාත් සභාව මගින් 2014 නොවැම්බර් 26 දින ලබා දී තිබූ අංක SG RD – 7992 දරණ ගලිබවුසරය පුහුණු රියදුරෙකු හා ගලි බැහැර කිරීමේ ස්ථානයක් නොමැති වීම මත වර්තමානය වනවිට ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබුණි.

ii. ධාවන තත්ත්වයේ නොමැති අංක SG RA – 5736 දරණ ට්‍රැක්ටරය (එංජිම), අංක 252 – 6374 දරණ කැබ් රථය, අංක WP HC – 3718 දරණ වෑන් රථය සහ අංක SG HP – 3816 දරණ ට්‍රැක්ටරය (එංජිම) යන වාහන නැවත අළුත්වැඩියා කිරීම හෝ රාජ්‍ය මුදල් චක්‍රලේඛ 353 ප්‍රකාරව භාවිතයෙන් ඉවත් කිරීම හෝ වෙන්දේසි කිරීමට කටයුතු කර නොමැතිව සභා පරිශ්‍රයේ ගාල් කර තිබූ අතර, උක්ත වාහන සම්බන්ධයෙන් ධාවන තත්ත්වයේ නොමැති බව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත වාර්තා කිරීමද සිදුකර නොතිබුණි.

(ආ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම
-----------------------------------------------------------------

i. සභාව සතු ඉඩකඩම් ලෙස හඳුනාගෙන ඇති සතිපොල, ක්‍රීඩාපිටි, කසල ඉවත් කරන ඉඩම වශයෙන් වන ඉඩම් කට්ටි 06 ක් සභාවට නිසි පරිදි පවරා ගනිමින් එම ස්ථාන ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

ii. කොලොන්න කෝන්ගහහේන නැමති රූඩ් 02 පර්චස් 34 ක ඉඩම සුසාන භූමියක් ලෙස මිනුම් කටයුතු කිරීම සඳහා 2012 ජූනි 26 දින අංක 091011 දරණ චෙක්පතින් මිනුම් ගාස්තු රු. 13,440 ක් ගෙවීම් කර ඇති නමුත් වර්තමානය වනවිට එම ඉඩමේ නව සභා ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පැවතියද, එම ඉඩම සභාවට පවරා ගැනීමේ කටයුතු නිම කර නොතිබුණි.

3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
--------------------------------

කසල කළමනාකරණය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදීද නිසි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වුවද, නගරයේ එකතු වන දිරන කසල විවෘත භූමියක වලවල් කපා වල දැමීම වර්තමානය වන විටද ක්‍රියාත්මක කරන බව නිරීක්ෂණය විය.

04. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය.
------------------------------------------

4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය
------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම
----------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

05. පද්ධති හා පාලනය
-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) සන අපද්‍රව්‍ය කළමනාකරණය